SLGURU.LK

ශාන්ත පීතර විද්‍යාල - කොළඹ 04

Virtue and Truth

දෙවන වාර පරීක්ෂණ - 2019

07 ශ්‍රේණිය - බුද්ධ ධර්ම

කාලය පැය

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ආදර්ශවත් නායකත්වයක් ප්‍රකට කරවන ජාතක කථාවක් වනුයේ _____ යි.

i. අපණ්ණක ජාතකය
ii. සස ජාතකය
iii. බක ජාතකය
iv. සුවර්ණ හංස ජාතකය

02. බුදුන් වහන්සේ රෝග හටගන්නා ක්‍රම අටක් පිළිබඳ _____ දේශනා කළ සේක.

i. රතන සූත්‍රය
ii. ගිරිමානන්ද සූත්‍රය
iii. මංගල සූත්‍රය
iv. අනන්තලක්ඛණ සූත්‍රය

03. අතීත, වර්තමාන, අනාගත යන තුන් කාලයම අත්ලෙහි වූ නෙල්ලි ගෙඩියක් සේ දත් හෙයින් බුදුන් වහන්සේ _____ සේක.

i. සුගත
ii. විජ්ජාචරණ
iii. සම්මා සම්බුද්ධ
iv. ලෝකවිදූ

04. ධම්ම පදය බෞද්ධයාගේ අත් පොතයි. එය සූත්‍ර පිටකයේ _____ අයත්ය

i. අංගුත්තර
ii. සංයුක්තර
iii. බුද්දක
iv. වජ්ජිම

05. බුදුන් වහන්සේ දෙවන වරට ලක්දිවට වැඩම _____ කළේ ය.

i. කැළණියට
ii. නාගදීපයට
iii. මහියංගනයට
iv. ශ්‍රීපාද ස්ථානයට

06. කළගුණ සැලකීමේ ගුණය බුද්ධ ශ්‍රාවකයන් වහන්සේලා තුළ ද දැකිය හැකිය. ඒ සඳහා හොඳම නිදසුන වනුයේ _____ ය.

i. පුණ්ණ තෙරුන්
ii. රාහුල තෙරුන්
iii. සැරියුත් තෙරුන්
iv. මංගල තෙරුන්

07. රජවරුන් විසින් අගවිනිසුරු තනතුරට පවා භික්ෂූන් වහන්සේ පත්කර ඇත. ඒ සඳහා හොඳම නිදසුනක්ට _____ නම් කළ හැක.

i. රාහුල තෙරුන්
ii. කුඩාපොල හිමි
iii. වාරියපොල ශ්‍රී සුමංගල හිමි
iv. ගෝදත්ත තෙරුන්

08. සතර බ්‍රහ්ම විහරණ වලට අයත් වනුයේ _____ ය.

i. ප්‍රිය වචනය
ii. කරුණාව
iii. අනුකම්පාව
iv. සන්‍යාසි

09. කෙනෙකුගේ දියුණුව දැක සතුටුවීම _____ ලෙස නම් කෙරේ.

i. මෛත්‍රිය
ii. නිර්ලෝභීකම
iii. මුදිතාව
iv. උපේක්ඛාව

10. කර්ණීයමෙත්ත සූත්‍රයේ සියලු සත්ත්වයෝ යන්නෙහි "අණුක" යන්නෙහි අර්ථය වනුයේ,

i. උපන් සත්ත්වයෝ
ii. ඉතා සිහින් සත්ත්වයෝ
iii. තැති නොගන්නා සත්ත්වයෝ
iv. ළඟ ඇති සත්ත්වයෝ

(ලකුණු 2×10=20)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

02. කෙටි පිළිතුරු සපයන්න.

i. තුම්බෑ ජටිලයන් නම් කරන්න.
ii. ත්‍රිවිධ චෛත්‍යය නම් කරන්න.
iii. තෙරුවන් නම් කරන්න.
iv. ත්‍රිකෝටික පාරිශුද්ධික ශීලය හඳුන්වන්න.
v. පන්සිල් රැකීමේ වටිනාකම් 03 ක් ලියන්න.
vi. "මිච්ඡා ආජීව" යන්නෙහි අරුත ලියා දක්වන්න.
vii. බුදුන් වහන්සේ අසරණයින්ට පිහිට වූ අවස්ථා 03 ක් නම් කරන්න.
viii. බුදුන් වහන්සේ පෙන්වා දී ඇති උපස්ථායකයකු තුළ තිබිය යුතු ගුණාංග 03 ක් නම් කරන්න.
ix. "අග්‍රශෂ්‍ය දානය" යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
x. පන්සලේ දී ඔබ කරන වතාවත් 03 ක් ලියා දක්වන්න.

(ලකුණු 3×10=30)

03. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. a. බුදුන් වහන්සේ ගත කළ සත් සතියේ සිව්වන සතියේ සිදු වූ විශේෂත්වය ලියා දක්වන්න. **(02)**
b. බුදුන් වහන්සේ සත් සතියේ වැඩ සිටි ස්ථාන 03 ක් නම් කරන්න. **(03)**
c. "තුන් ලොව තතු" ලෙසට යන ගාථාව හා අරුත ලියා දක්වන්න. **(05)**

ii. a. ඉවසීම මංගල කාරණාවක් ලෙස සඳහන් කොට ඇති සූත්‍රය කුමක් ද? **(02)**
b. බුදුන් වහන්සේ දේශනා කොට ඇති ඉවසීමෙන් ලැබෙන ආනිශංස ධර්ම 05 මොනවාද? **(05)**
c. ඉවසීම නොමැති නිසා සිදුවන සමාජීය ගැටලු 03 ක් ලියා දක්වන්න. **(03)**

iii. a. සිඟාලෝවාද සූත්‍රයට අනුව ශිෂ්‍යයකු ලෙස ඔබගෙන් ගුරුතුමා හට විය යුතු යුතුකම් 05 ක් ලියා දක්වන්න. **(05)**
b. සිගාලෝවාද සූත්‍රයට අනුව ගුරුවරයෙකුගෙන් සිසුන් හට විය යුතු යුතුකම් 05 ක් ලියා දක්වන්න. **(05)**

iv. a. බුදුන් වහන්සේ තුළ පැවති "අනේකංගදස්සී" යන්නෙහි අරුත ලියා දක්වන්න.
b. කර්මයට ගැති නොවී ඔබට ජීවිතය ජය ගත හැකි ක්‍රමවේද 03 ක් ලියා දක්වන්න.
c. නියාම ධර්ම 05 නම් කරන්න. (නිදසුන් අවශ්‍ය නැත.)

v. පහත සඳහන් මාතෘකා තුළින් 02 ක් ගැන කෙටි සටහන් ලියන්න.

a. අග්‍රදායකයා
b. අග්‍රදායිකාව
c. පන්සිල් **(ලකුණු 5×10=50)**

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

“The roots of education are bitter, but the fruit is sweet.” — Aristotle (commonly attributed)

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK
For Educational Purpose Only